# ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී වෙතින් දුරකථන සේවා සැපයීමේ කොන්දේසි සහ නියමයන්

( මෙහි මින්මතු "එස්එල්ටී" නමින් හඳුන්වනු ලබන ) ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සේවා සපයන අතර එස්එල්ටී වෙබ් පිටුවෙහි (www.slt.lk) සහ අදාල නීති යටතේ සම්පාදනය කරනු ලැබ ඇති රෙගුලාසි වලටද, කලින් කලට සංශෝධනය කර ඇති පරිදි මෙහි සඳහන් කොන්දේසි සහ නියමයන්ටද යටත්ව පාරිභෝගිකයා එම සේවා ලබාගෙන අඛණ්ඩව භාවිත කරනු ලබන්නේය.

පහත දැක්වෙන කොන්දේසි සහ නියමයන් සුදුසු සහ සුදුසු නොවන ක්‍රියාවන් සම්බන්ධ උපදෙස් මාලාවක් වශයෙන් සලකනු ලැබේ. එම උපදෙස් කිසිදු ආකාරයකින් සම්පූර්ණ උපදෙස් මාලාවක් නොවන අතර එලෙස අර්ථකථනය කළ යුතුද නොවේ. වඩාත් සවිස්තරාත්මක / අතිරේක තොරතුරු ශ්‍රී ලංකා ටෙලිකොම් වෙබ් පිටුවෙහි සඳහන් කර ඇත. මෙම ලේඛනයෙහි සහ එස්එල්ටී වෙබ් පිටුවෙහි (www.slt.lk) දැක්වෙන කොන්දේසි සහ නියමයන් සැලකිල්ලෙන් කියවා තේරුම් ගැනීම පාරිභෝගිකයාගේ වගකීම වේ.

පාරිභෝගිකයා වෙත දැනුම් දීමකින් තොරව කලින් කලට වෙබ් පිටුව සංශෝධනය කළ හැකි බව පාරිභෝගිකයා තව දුරටත් පිළිගනී. නමුත් පාරිභෝගිකයා සේවා ප්‍රයෝජනයට ගන්නා තෙක් එස්එල්ටී වෙබ් පිටුවෙහි පළ කර ඇති කොන්දේසි සහ නියමයන් පිළිබඳ යාවත්කාලීන වී එයින් බැඳී සිටීමට එකඟ වන අතර එසේ සංශෝධනය කළ කොන්දේසි සහ නියමයන්ට එකඟ විය නොහැකි වුවහොත් සේවා විසන්ධි කරන මෙන් පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත වහාම දැනුම් දෙනු ඇත.

## 1.0 සේවා සැපයීම

1.1 මෙම ගිවිසුම යටතේ පාරිභෝගිකයාට පහත දැක්වෙන ඕනෑම පැකේජයකට (මින්මතු සේවා යනුවෙන් හඳුන්වනු ලබන) මාරු විය හැක

- අ) මෙගා ලයින් සින්ගල් ප්ලේ - දුරකථන සේවා පමණි.
- ආ) මෙගා ලයින් ඩබල් ප්ලේ - දුරකථන සේවා සමග බ්‍රෝඩ් බෑන්ඩ් හෝ දුරකථන සේවා සමග Peo TV සේවා
- ඇ) මෙගා ලයින් ට්‍රිපල් ප්ලේ - දුරකථන සේවා සමග බ්‍රෝඩ් බෑන්ඩ් සහ Peo TV සේවා

1.2 ගෙවීමට ඉතිරිව ඇති සියළු හිඟ මුදල් ගෙවීමෙන් අනතුරුව, පාරිභෝගිකයාට, දැනට ඇතුලත්වසිටි-න පැකේජයෙන් තෝරාගත් නව පැකේජයකට මාරුවියහැකි අතර ඒ සඳහා පරිපාලන ගාස්තු වශයෙ-න් එස්එල්ටී අතිරේක මුදලක් අය කරනු ලැබේ.

1.3 සැපයීම් ක්‍රියාවලිය අතරතුර ඉල්ලුම් කරඇති මෙගාලයින් ඩබල් ප්ලේ හෝ මෙගා ලයින් ට්‍රිපල් ප්ලේ පැකේජය සැපයීමට දුරකථන මාර්ගයේ තත්ත්වය/ ධාරිතාව ප්‍රමාණවත් නොවන බව පෙනී ගිය හොත් එම පැකේජය තෝරාගත් පාරිභෝගිකයිනට බ්‍රෝඩ්බෑන්ඩ් සහ/හෝ Peo Tvසේවාව/ සේවාවන් සැපයීම අවලංගු කිරීමේ අයිතිය එස්එල්ටී සතුවේ.

## 2.0 කාල සීමාව

2.1 ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී විසින් සේවා සපයනු ලබන දින පටන් මෙම ගිවිසුම බලපැවැත්වෙන අතර මෙහි 08 වැනි වගන්තිය අනුව එස්එල්ටී විසින් හෝ පහත දැක්වෙනපරිදි පාරිභෝගිකයා විසින් සේවා අවසන් කරන තෙක් එය වලංගු වේ.

2.2 පාරිභෝගිකයාට එක්අවුරුදු බැඳීම් කාලසීමාව අතරතුර මෙම ගිවිසුම අවසන්කළ නොහැකිය. කෙසේ වෙතත් ඉතිරිව ඇති සියළුම හිඟ මුදල් ගෙවීමෙන් අනතුරුව එස්එල්ටී හි පවත්නා ගාස්තු ප්‍රමාණ අනුව එස්එල්ටී විසින් ගණන් බලන ලද සේවා අවසන් කිරීමේ ගාස්තු කලින් ගෙවා පාරිභෝගිකයාට ගිවිසුම අවසන් කිරීම සඳහා ඉල්ලුම් කළ හැකිය

2.3 බැඳීම් කාලසීමාව අවසන් වීමෙන් අනතුරුව පාරිභෝගිකයාට තෝරා ගත් පැකේජය වෙනස් කිරීමට හෝ සේවා අවසන් කිරීමට ඉල්ලුම් කළ හැකිය.

## 3.0 වගකම් බැහැර කිරීම

3.1 හැකිතාක්දුරට සේවාබාධාවන් අවමව සේවය සැපයීම සහතිකවනු පිණිස එස්එල්ටී අවංකවම සාධාරණ වාණිජමය උත්සාහයන් ගනු ලබන නමුත් සපයනුලබන සේවාව බාධා හෝ දෝෂ රහිත සේවාවක් ලෙසට සහතික කරනු නොලැබේ.

3.2 ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට පාලනය කළ නොහැකි කිසියම් කරුණක් මතහෝ පාරිභෝගිකයාගේ නොසැලකිල්ල හෝ අනිසි භාවිතය හෝ,හදිසි අනතුරක් හෝ, ස්වාභාවික විපතක් හේතුවෙන් දුරකථන ස්ථාපනයට සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආනුෂංගිකව හෝ වෙනත් ආකාරයකින් සිදු වන කිසියම් හානියක්, හෝ අලාභයක් සඳහා එස්එල්ටී වගකීමෙන් බැඳී නොසිටින බව පාරිභෝගිකයා වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

3.3 අන්තර්ජාලය හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් පද්ධතිය හරහා සම්ප්‍රේෂණය වන තොරතුරු එස්එල්ටී විසින් පාලනය නොකරන අතර එස්එල්ටී පද්ධතිය හරහා සම්ප්‍රේෂණයවන ඕනෑම තොරතුරක් ප්‍රයෝජනයට ගැනීමේ තනි අවධානම පාරිභෝගිකයා විසින් දරාගත යුතුය. සේවා ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සිදුවිය හැකි කිසියම් පාඩුවක්, හානියක්, හෝ සේවා බාධාවක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම එහි කොන්ත්‍රාත්කරුවන් හෝ අනුබද්ධිත සමාගම් හෝ ඒවායේ අදාල සේවකයින් වගකීම දරනු නොලබන්නේය.

3.4 ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට පාලනයකළ නොහැකි හේතූන් මත, පාරිභෝගිකයාගේ ක්‍රියාවක සහ / හෝ ඔහුගේ /ඇගේ /එහි පරිගණකයේ ප්‍රතිඵලයක් වශයෙන්, වයිරස් හෝ, ස්පෑම් ඩවුන්ලෝඩ් කිරීම සහ අප්ලෝඩ් කිරීම ඇතුලුව එහෙත් එයටම සීමානොවූ, පාරිභෝගිකයාගේ පාර්ශවයෙන් සිදු වන නීත්‍යානුකූල නොවන ක්‍රියාවකින්, අනවසර ක්‍රියාවකින්, හිතාමතා සිදුකරන හානියකින්, නොසළකා හැරීමකින්, පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම වන්දියෙන් නිදහස් කරනුලබයි

3.5 සේවා භාවිතය හෝ භාවිතයට නොහැකි වීම හේතුකොටගෙන ඇතිවිය හැකි කිසියම් වක්‍ර, විශේෂ, ආනුෂංගික, හෝ දැඩි හානියක්/අලාභයක්/හිමිකමක් වෙනුවෙන්, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම පාරිභෝගිකයාට හෝ එහි සේවකයින්ට/ නියෝජිතයන්ට හෝ බලපත්‍රලාභීන්ට වගකීමට බැඳී නොමැත.

3.6සේවා මගින් සම්ප්‍රේෂණය/විකාශය කරනු ලබන අපකීර්තිමත් අන්තර්ගතයන් සහ /හෝ කිසියම් හෙළා දැකීම් හෝ එස්එල්ටී පාරිභෝගිකයෙකු විසින් සේවා ප්‍රයෝජනයට ගැනීම මගින් ප්‍රසිද්ධ කළ හැකි නොසරුප්, අසභ්‍ය ආක්‍රෝශකාරී හෝ තර්ජනාත්මක ආකාරයේ හෝ දේශපාලනික, වාර්ගික, ආගමික හෝ සදාචාරාත්මක හේතූන් මත අහිතකර දත්ත සහ අපහාසාත්මක සාවද්‍ය දත්ත, බුද්ධිමය දේපළ, අයිතිවාසිකම් කඩකිරීම සඳහා තුන්වැනි පාර්ශවයකින් කෙරෙන ඕනෑම හිමි කම් පෑමකින් පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම වන්දියෙන් නිදහස් කරනු ලබන්නේය.

## 4.0 වන්දි පූර්ණය

4.1 පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් සේවාවන් නොසැළකිලිමත්ව, වංචනිකව හෝ චේතනාන්විතව අවප්‍රයෝජනයට නොගන්නා අතර, ඔහුගේ අවසරලත් බලපත්‍රලාභීන් හෝ අනවසර පුද්ගලයන් විසින් ද ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනික ප්‍රතිරූපය විනාශවන ආකාරයෙන් සේවාවන් අවප්‍රයෝජනයට නොගන්නා බවට සහතික වේ. එසේ කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට පාරිභෝගිකයාගෙන් අලාභය ඉල්ලීමට හිමිකම් ලබන මෙම ගිවිසුම දැඩිව උල්ලංඝණය කිරීමක් වශයෙන් සැළකේ. තවද, මෙම කොන්දේසි උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන්, කිසියම් තුන්වැනි පාර්ශවයක හිමිකම් පෑමකට එරෙහිව එස්එල්ටී වන්දියෙන් නිදහස්කර ගැනීමටත් පාරිභෝගිකයා තවදුරටත් එකඟ වේ.

4.2 පාරිභෝගිකයාගේ සහ/හෝ ඔහුගේ / ඇගේ / එහි සේවකයින්ගේ, අවසරලත් නියෝජිතයින්ගේ හෝ ඒජන්ත වරුන්ගේ නොසළකා හැරීමක් හෝ අධිකාරයක් හෝ කිසියම් ක්‍රියාවක් හෝ හෙළා දැකීමක් සහ/ හෝ අපහාසාත්මක අන්තර්ගතයක්, ලිඛිත අපහාසයක්, කිසියම් බුද්ධිමය දේපළ, අයිතිවාසිකම් කඩකිරීමක් හෝ මෙම ගිවිසුම අවසන් කිරීම සහ/හෝ සේවාවිසන්ධි කිරීම/අත්හිටුවීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන කිසියම් පාඩුවක් සහ /හෝ හානියක්, හිමිකමක්, ක්‍රියාවක් සම්බන්ධයෙන් එස්එල්ටී වන්දියෙන් නිදහස් කර හානියෙන් තොරව රඳවා තබයි.

## 5.0 පාරිභෝගිකයාගේ වගකීම්

මෙම ගිවිසුම යටතේ එස්එල්ටී විසින් සපයනුලබන සේවාවන් සහ පැකේජයන්ට අදාලව නිවැරදි සහ සම්පූර්ණ තොරතුරු පාරිභෝගිකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

5.1 පාරිභෝගිකයා විසින් මෙහි 10 වැනි වගන්තිය ප්‍රකාර සේවා ගාස්තු ගෙවිය යුතුය.

5.2 මෙහි 10වැනි වගන්තියේ දැක්වෙන පරිදි, පාරිභෝගික පරිශ්‍රයේ ස්ථාපිත උපකරණ සම්බන්ධයෙන් පූර්ණ වගකීම පාරිභෝගිකයා විසින් දැරිය යුතුය.

5.3 ශ්‍රී ලංකා ටෙලිකොම් ලිඛිත අවසරය නොමැතිව මෙහිදැක්වෙන සේවාවන් පැවරීම, කුලියටදීම, නැවත විකිනීම හෝ වෙනත් අයුරකින් කටයුතුකිරීම නොකළයුතු අතර, පණිවුඩ එකතු කිරීමේ, ලබා ගැනීමේ, බෙදා හැරීමේ ව්‍යාපාර හෝ දුරකථන ස්ථාපනයෙන් සම්ප්‍රේෂණය වන වෙනත් සන්නිවේදනයන් හෝ එවැනි ව්‍යාපාරයක් කිරීමට පාරිභෝගිකයාට හිමිකම් නොමැත. මෙම සේවාව විනෝදාත්මක සහ පුද්ගලික ප්‍රයෝජනය සඳහා පමණක් වන අතර වාණිජමය භාවිතය, නැවත විකිනීම ආදිය සඳහා හවුලේ ප්‍රයෝජනයට නොගත යුතුය.

5.4 කිසියම් නීත්‍යානුකූල නොවන, සදාචාරාත්මක නොවන හෝ අනිසි අරමුණක් සඳහා රජය/ පාර්ලිමේන්-තුව / නියාමන ආයතන/නීතිමය ආයතන හෝ අධිකරණය විසින් නිකුත් කරන ලද නියෝග / රීති රෙගුලාසි/නීති උල්ලංඝණය කෙරෙන කිසියම් ක්‍රියාවකට මෙම ගිවිසුම යටතේ සපයනු ලබන සේවාවන් ප්‍රයෝජනයට ගැනීමට පාරිභෝගිකයාට බලය නැත. පාරිභෝගිකයා විසින් එවැන්නකට පාරිභෝගික පරිශ්‍ර උපකරණ භාවිතකිරීමට ඉඩදුනහොත්, එස්එල්ටී විසින් සේවාවන් විසන්ධි කර පාරිභෝගිකයාට වෙන් කර ඇති දුරකථන ස්ථාපනය ඉවත් කරගනු ලබන අතර දුරකථන ස්ථාපනය ඉවත් කර ගැනී-මෙහි / අස්කර ගැනීමෙහි අනුෂංගයක් වශයෙන් අලාභය හෝ වෙනත් කිසියම් ඉල්ලීමක් කිරීමට පාරිභෝගිකයාට හිමිකමක් නැත.

5.5 එස්එල්ටී විසින් සපයන ලද, පාරිභෝගික පරිශ්‍ර උපකරණ භාවිතය සම්බන්ධයෙන් එස්එල්ටී හෝ එය වෙනුවෙන් අසනු ලබන ප්‍රශ්නවලට පාරිභෝගිකයා පිළිතුරු දියයුතුය. එබඳු ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීම නිසා, දුරකථන ස්ථාපනය විසන්ධි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාරිභෝගිකයාට මොනයම් ආකාරයකින් හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට එරෙහිව හිමිකම් පෑමට නොහැක. එසේම ගෙවනු ලැබූ ග්‍රාහක මුදල් ප්‍රතිපූර්ණය කිරීමටදශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම බැඳී නොමැත.

5.6 මෙම දුරකථන ස්ථාපනය මගින් පාරිභෝගික පරිශ්‍රයට සංක්‍රමණය වියහැකි අධිබල විදුලි සැර (ශ්‍රීලංටෙ පරිශ්‍රයෙන් නිකුත්නොවන)නිසා සිදුවියහැකි අනතුරු හෝ හානි සම්බන්ධයෙන් පාරිභෝගිකයාට ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට එරෙහිව කිසියම් හිමිකම් පෑමක් කළනොහැකි අතර වෙනත් කිසියම් පුද්ගලයෙකු විසින් කරනුලබන එවැනි හිමිකම් පෑමකින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම වන්දියෙන් නිදහස් කරනු ලැබේ.

5.7 පාරිභෝගිකයා විසින් අවශ්‍ය අවස්ථාවන්හිදී උපකරණ ස්ථාපනයට පරීක්ෂා කිරීමට සහ නඩත්තුවටද , උපකරණ ක්‍රියාකාරීත්වයටද, ප්‍රමාණවත් විදුලිබලය නොමිලයේ ලබා දිය යුතුය.

5.8 කණු සිටුවීම, රැහැන් ඇදීම, දුරකථන ස්ථාපනය පරීක්ෂා කිරීම, සහ නඩත්තු කිරීම ආදිය සඳහා, පාරිභෝගිකයා විසින් තමාට සැපයිය හැකි සෑම පහසුකමක්ම නොමිලයේ එස්එල්ටී වෙත ලබා දිය යුතුය. එසේම, පාරිභෝගිකයා විසින් ඕනෑම සාධාරණ වේලාවක, ශ්‍රී ලංකා ටෙලිකොම් සේවකයින්ට, ඉහත කී සියළු අරමුණු සඳහා හෝ කවර වූ එක් අරමුණක් සඳහා හෝ පාරිභෝගිකයාගේ පාලනය යටතේ පවතින සෑම පරිශ්‍රයකටම නිදහසේ ඇතුලුවීමට අවසර දිය යුතු අතර, වෙනත් පුද්ගලයෙ-කු ගෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය වේ නම්, එස්එල්ටී ඉල්ලීම අනුව, පාරිභෝගිකයා විසින් එම අවසරයද, ලබාගත යුතුය. නිදහසේ ඇතුලු වීමට නොහැකිවීම හේතුවෙන් මෙහි ඉහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට එස්එල්ටී අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, පාරිභෝගිකයාට සිදුවිය හැකි කිසියම් අලාභයක් හෝ, හානියක් සම්බන්ධව එස්එල්ටී වග කියනු නොලැබේ.

## 6.0 පාරිභෝගිකයාගේ ඉල්ලීම මත විසන්ධි කිරීම

6.1 ගිවිසගත් එක් අවුරුදු බැඳීම් කාල සීමාවෙන් පසුව පාරිභෝගිකයාට පැකේජය යටතේ ලබා ගත් සේවාවන් මාස තුනක් ඉක්මවා නොයන කාලසීමාවක් සඳහා තාවකාලිකව විසන්ධි කරන ලෙස ඉල්ලමි-න් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වෙත ලිඛිත ඉල්ලීමක් කළහැක.එබඳු අවස්ථාවක, ඉල්ලා සිටින කාල සීමාව සඳහා, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට දුරකථන මාර්ගය විසන්ධිකර තැබිය හැකි අතර, විසන්ධි කරන කාලසීමාව සඳහා සාමාන්‍ය බදුකුලියට අමතරව, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම විසින් කලින් කලට සංශෝදනය කළ හැකි අමතර මුදලක් අය කරනු ලැබේ.

6.2 දුරකථන මාර්ගය විසන්ධි කළහොත්, අදාල අනෙකුත් පහසුකම්ද ඉබේටම අත්හිටවනු/ වසන් වනු ඇත.

6.3 කාර්මිකදෝෂ සහ/හෝ බිඳවැටීම් නිවැරදිව කිරීම සඳහා එස්එල්ටී හැකි උපරිම ප්‍රයත්නයන් දරන අතර,ඒවා නිවැරදිව කළ නොහැකි නම්, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම එවැනි කාර්මික දෝෂ/ බිඳ වැටීම් නිවැරදිව කළ නොහැකි බවට සහතික කරන අතර පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු මාසික බදු සහ / හෝ සේවා ගාස්තු ඇතුලුව එහෙත් ඊටම සීමා නොවූ ගෙවීමට ඉතිරිව ඇති සම්පූර්ණ හිඟ මුදලම ගෙවීමෙන් අනතුරුව සේවාවන් අවසන් කරනු ලැබේ.

6.4 මේ යටතේ ක්‍රියාත්මක වූ කිසියම් විසන්ධි කිරීමක් සඳහා, සේවා සම්බන්ධ කිරීමේ ගාස්තු, මාසික බදුසේවා භාවිතා කිරීමේ ගාස්තු සහ/හෝ වෙනත් කිසියම් ගාස්තුවක් ඇතුලුව පාරිභෝගිකයා විසින් සිදුකරන ලද ඕනෑම ගෙවීමක් ආපසු ගෙවීමට හෝ කිසියම් හිමිකමක් ගාස්තුවක් ගෙවීමට එස්එල්ටී බැඳී නොමැත.

6.5 සේවා අවසන්කිරීමේදී, පාරිභෝගිකයා විසින් මනා තත්වයෙන් වහාම ග්‍රාහකපරිශ්‍ර උපකරණ එස්එල්ටී වෙත භාරදිය යුතුය. උපකරණවල සාමාන්‍ය ගෙවී යෑම් බලාපොරොත්තු වේ. දැනුම් දීමකින් පසුව, ශ්‍රී ලංකා ටෙලිකොම්හි බලයලත් පුද්ගලයින්ට මෙම කාර්යය සඳහා,පාරිභෝගික පරිශ්‍රයට ඇතුලු වීම පිණිස පාරිභෝගිකයාගේ අවසරය ලබා දිය යුතු අතර, එස්එල්ටී වෙත කිසියම් තැන්පතුවක් කර ඇත්නම්, එය ආපසු ලබා ගැනීමට පාරිභෝගිකයාට හිමිකම් ඇත.

6.6 පාරිභෝගිකයා සහ යාබද පරිශ්‍රයේ පදිංචිකරු හෝ නිවස අයිතිකරු අතර දුරකථන ස්ථාපනය සම්බන්ධයෙන් ඇති වන යම් අර්බුදයක් මත දුරකථන ස්ථාපනය සම්පූර්ණ කිරීමට අසමත්වීම හෝ ප්‍රමාදවීම සම්බන්ධයෙන් එස්එල්ටී පාරිභෝගිකයා හට වගකිවයුතු නොවන්නේය.

## 7.0 ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් විසන්ධි කිරීම

7.1 පොදු නීතිය යටතේ සහ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් එස්එල්ටී වෙබ් පිටුවෙහි පලකරන ලද වගන්ති උල්ලංඝණය කිරීමක් හෝ, මෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන්හි කුමන හෝ උල්ලං-ඝණය කිරීමකට, ආරෝපනය වන ඕනෑම හේතුවක් මත කිසියම් ග්‍රාහක ගිණුමක් අත්හිටුවීමේ අයිතිය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සතුය.

7.2 සේවා හේතූන්මත ඕනෑම අවස්ථාවක දුරකථන ස්ථාපනය සම්බන්ධ කරඇති ස්ථානයෙන් එය විසන්ධි කර ප්‍රදේශයේ ඇති වෙනත් විනිමය ස්ථානයකට නැවත සම්බන්ධ කිරීමටද ඕනෑම අවස්ථාවක පාරිභෝගිකයාට වෙන්කරදීඇති දුරකථන අංකය වෙනස් කිරීමට හෝ පාරිභෝගිකයා සම්බන්ධ කර ඇති විනිමය ස්ථානයේ නම සහ අංකය වෙනස් කිරීමටද ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට හැකිවන්නේය.

7.3 එස්එල්ටී වෙතින් සපයනලද කිසියම් සේවාවක් සඳහා පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් ගෙවීම් කිරීමට තිබීම ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී වෙතින් සපයන ලද සියලූ සේවාවන් අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හේතුවක් වන්නේය. ඉහත සඳහන් ගෙවීම් වලට පාරිභෝගිකයා විසින් අදාල කාල සීමාව තුල ගෙවීමට ගිවිසගෙන ඇති සියලූම මාසික බදු කුළියෙහි ශේෂ ගෙවීම්ද ඇතුල්වේ.

## 8.0 සේවා පහසුකම් අවසන් කිරීම

පහත සඳහන් හේතූන් මත ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට මෙම ගිවිසුම අවසන් කිරීමට හැකි වන්නේය. කෙසේවෙතත් එවැනි අවසන් කිරීමක් හේතුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාග-ම පාරිභෝගිකයාගෙන් හෝ ඔහුගෙ / ඇයගේ/ එහි, පොල්මත්කරුගෙන් හෝ අද්මිනිස්තාසිකරුගෙන් හෝ අනුප්‍රාප්තිකයින්ගෙන් හෝ පැවරුම්ලාභීන්ගෙන් හෝ හිඟමුදල් අයකරගැනීම වලක්වන්නේ නැත.

8.1 පාරිභෝගිකයා විසින් ගෙවියයුතු කිසියම් දායක මුදලක් හෝ අතිරේක ගාස්තුවක්, අලාභයක් හෝ වියදමක් ගෙවීම සඳහා දැනුම් දීමක් කර මාසයක් ගතවූ පසුවද ගෙවීම් කර නැත්නම්,

8.2 පාරිභෝගිකයා වස්තු භංගත්වයට පත්වූවකු වශයෙන් විනිශ්චය කර ඇත්නම් හෝ ණය හිමියන් සමග යම් වාසිදායක සමතයකට හෝ එකඟතාවයකට පත්ව ඇත්නම්,

8.3 සමාගමක් සම්බන්ධයෙන් නම් එය වසා දමනු ලැබුවොත් හෝ වත්කම් භාරයට ගතයුත්තෙකු පත් කර ඇතිනම්,

8,4 රජයේ අධිකාරයක් / නියාමන ආයතනයක් විසින් නිකුත් කරන ලද බලපත්‍රය කිසියම් හේතුවක් මත නැවත අලුත් නොකළහොත් හෝ ඉල්ලා අස් කර ගත්තොත්,

8.5 දුරකථන ස්ථාපනය විසන්ධි කරනු ලැබ ඇත්නම් සහ එසේ විසන්ධි කරන ලදකාල සීමාව අඛණ්ඩව සිවු මසක් (04) ඉක්මවා යන්නේනම්.

8.6 පාරිභෝගිකයා මෙහි අඩංගු වන, කොන්දේසි සහ නියමයන් පිළිපැදීමට අපොහොසත් වෙයි නම්,

8.7 දුරකථන ස්ථාපනය ඉදිකිරීමට හෝ පවත්වාගැනීමට අවශ්‍ය බලපත්‍ර මාර්ග පහසුකම් අවසර හෝ පරවශතා ලබාගැනීමට හෝ පවත්වා ගැනීමට කුමන හෝ අවස්ථාවක එස්එල්ටී අපොහොසත්වේ නම්,

8.8 පාරිභෝගිකයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිකරන ලද විදුලි ආලෝක හෝ විදුලි බලාගාරයක් මගින් හෝ වෙනත් හේතුවක් නිසා හෝ දුරකථන ස්ථාපනයට ඇති විය හැකි හානි හෝ අන්තරායක බලපෑම් වැළැක්වීම පිණිස, දුරකථන ස්ථාපනය වෙනස් කිරීමට යන සහතිකකළ වියදම ගෙවන බවට, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට අවශ්‍යආකාරයෙන් වහාම පොරොන්දුවක් දීමට පාරිභෝගිකයා අසමත් වේ නම් උපකරණ ස්ථාපනය හා භාවිතය සඳහා අවශ්‍ය අනුමැතිය හෝ අවසරය ලබා ගැනීමට පාරිභෝගිකයා අසමත් වේ නම්, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට දැනුම් දීමකින් අනතුරුව සපයන ලද පහසුකම/පහසුකම් කිරීමට හැකි වන අතර, පාරිභෝගිකයා කිසියම් ගෙවීමකට හෝ වන්දියකට හිමිකම් කියනු නොලැබේ.

## 9.0 ස්ථානය වෙනස් කිරීම

### 9.1 වෙනස් කිරීම්

9.1.1 දුරකථන ස්ථාපනයද, ඊට සවිකළ කොටස් සහ උපාංගද, ඇතුළුව දුරකථන රැහැන් මාර්ගය යම්තාක් දුරට දුරකථන ස්ථාපනය සවිකොටඇති පරිශ්‍රයට අයත් සීමාව තුළ වේද, ශ්‍රීලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට පාරිභෝගිකයාගේ ඉල්ලීම මත සුදුසු යැයි හැඟී ගියහොත් ඒවායේ කුමන හෝ වෙනසක් සිදු කිරීමට හෝ දුරකථන ස්ථාපනය එම පරිශ්‍රය තුලම වෙනත් ස්ථානයකට රැගෙනයාමට හෝ හැකිය එබදු වෙනස් කිරීමට හෝ රැගෙන යාමකට අදාල ගාස්තු පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම ඉල්ලාසිටි කල්හි ගෙවිය යුතුය.

9.1.2 එසේම දුරකථන ස්ථාපනයේ යම් වෙනසක් කිරීම පාරිභෝගිකයාගේ හෝ මහජනතාවගේ යහපතට හේතුවේ යයි ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම අදහස් කරන කල්හි, පාරිභෝගිකයාගේ ඉල්ලීමක් නොමැතිව සහ ඔහුගේ / ඇයගේ / එහි වියදමෙන් තොරව, කවර හෝ අවස්ථාවක ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට එවැනි වෙනසක් සිදුකළ හැකිය.

9.1.3 එබදු වෙනසක් සිදුකිරීමේ ප්‍රතිපලයක් වශයෙන් පාරිභෝගිකයාට සිදුවන අලාභයක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වගකිව යුතු නොවන්නේය. එවැනි වෙනසක් සිදුකිරීම හේතුවෙන්, සපයනු ලබන සේවාවන්ට පූර්ණ වශයෙන්හෝ අර්ධ වශයෙන් අවහිර වීම වෙනුවෙන් ග්‍රාහක මුදලින් කිසියම් කොටසක් ආපසු ලබා ගැනීමට පාරිභෝගිකයාට හිමිකම් නොමැත.

9.2 සේවා සපයනු ලැබඇති ස්ථානය වෙනස් කරනමෙන් යම් පාරිභෝගිකයෙකු ඉල්ලීමක් කළ කල්හි, එය නැවත ස්ථානගත කිරීමට අදාල වියදම් පාරිභෝගිකයා දරන්නේ නම්, සපයා ඇති සියලුම සේවාවන් අලුත් ස්ථානයේ ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම සෑම උත්සහයක්ම දරනු ලබන්නේය. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට තාක්‍ෂණිකමය හේතූන් මත දැනට සපයා ඇති සේවා /පැකේජ/විශේෂ පහසුකම් නව ස්ථානයට සැපයීමට නොහැකිවන අවස්ථා වලදී,ඒ සම්බන්ධ බැඳීම් වලින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම මුදවා ගැනීමේ වගකීම පාරිභෝගිකයා මෙයින් භාර ගන්නා අතර, සැපයිය හැකි සේවාවන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට යෝග්‍ය පරිදි නව ගිවිසුමකට ඇතුලත් වියහැක.

## 10.0 ගාස්තු සහ ගෙවීම්

10.1 සේවා සැපයීම සඳහා සම්බන්ධ කිරීමේ ගාස්තු, භාවිතා කිරීමේ ගාස්තු, මාසික බදුකුළී, වෙනත් අය කිරීම් සහ බදු ඇතුලුව, එහෙත් එයටම සීමා නොවූ අදාල සියලු ගාස්තු නියමිත දිනට ගෙවීමට පාරිභෝගිකයා භාර ගනී.

10.2 අනුපාතික බලපෑම් ඇතුලුව එහෙත් එයටම සීමා නොවූ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ආරෝපණීය කළ නොහැකි හේතූන් මත සිදුවන සේවා අවහිරතාවයකදී, සේවා ලබා ගැනීම පිණිස ගෙවන ලද සම්බන්ධ කිරීමේ ගාස්තු සහ/හෝ මාසික කුළිය සහ/හෝ වෙනත් කිසියම් ගෙවී මක් කුමන ආකාරයකින් හෝ ආපසු ලබා ගැනීමට පාරිභෝගිකයාට හිමි කමක් නැත.

10.3 පාරිභෝගිකයාගේ ඉල්ලීම මත එස්එල්ටී වෙතින් සපයනු ලබන සේවා සහ පහසුකම් වෙනුවෙන්ද, දුරකථන ස්ථාපනයෙන් ආරම්භ වන ඇමතුම් වෙනුවෙන් හෝ ඊට ලැබෙන ඇමතුම ලබන්නා විසින් ගාස්තු ගෙවන ඇමතුම් (collect calls) වෙනුවෙන්ද, එස්එල්ටී විසින් අයකරනු ලබන සියලුම පණිවුඩ ගාස්තු අමතර උපකරණ හෝ ශාඛා මාර්ග (Extention lines)සඳහා ගාස්තු හෝ වෙනත් ගාස්තු හෝ වෙනත් ගාස්තු සහ අයකිරීම් ඉල්ලාසිටි කල්හි, පාරිභෝගිකයා විසින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම වෙත ගෙවිය යුතුය. බිල්පත ලැබී දින 14 ක් ඇතුලත ගාස්තු ගෙවීමට නියමිත බැවින්, ඒ සියලු ගාස්තු සහ අය කිරීම් බිල්පතෙහි සඳහන් කාල සීමාව ඇතුළත එස්එල්ටී වෙත ගෙවිය යුතුය.

10.4 පාරිභෝගික පරිශ්‍රයේ පිහිටුවා ඇති දුරකථන ස්ථාපනයේ යම් කොටසක් හෝ කොටස් සොරකම් කිරීම/නැතිවීම හෝ ගින්නකින් හෝ වෙනත් අයුරකින් විනාශවීම හේතුවෙන්, එම කොටස හෝ කොටස් අළුත්වැඩියා කිරීම/අමතර කොටස් යෙදීම / අළුත් කිරීම සම්බන්ධව සහතික කළ වියදම ඉල්ලා සිටි කල්හි පාරිභෝගිකයා විසින් එස්එල්ටී වෙත ගෙවිය යුතුය.

10.5 මූලික වශයෙන්ම කිසියම් තාක්‍ෂණික හේතුවක් නිසාහෝ තදන්තරව කිසියම් තාක්‍ෂණික දෝෂයක් සහ /හෝ බාධාවක් දිගින් දිගටම පාරිභෝගිකයා අත් විඳීම මත එම තාක්‍ෂණික දෝෂය සහ/ හෝ බාධාව පාරිභෝගිකයා විසින් නිසි පරිදි දැනුම් දී එය නිවැරදි කළ නොහැකි බවට ශ්‍රී ලංකා ටෙලිකොම් විශ්වාස කරයි නම් සහ සේවා සැපයීමට ශ්‍රී ලංකා ටෙලිකොම් අසමත් වන්නේ නම් සේවා සම්බන්ධ කිරීමේ ගාස්තු නැවත පාරිභෝගිකයා වෙත ගෙවනු ලබන අතර, මෙම ගිවිසුම අවසන් කළා සේ සළකනු ලැබේ.

## 11. වෙනස් කිරීම්

11.1 එස්එල්ටී වෙතින් සපයනු ලබන සේවාවන් සඳහා ගෙවිය යුතු ගාස්තු කලින් කලට සිදු කරනු ලබන අයක්‍රම සංශෝධන වලට යටත් වනඅතර එස්එල්ටී විසින් පනවනු ලබන නීති රෙගුලාසි හෝ වෙනත් කිසියම් නීතියක් යටතේ හෝ 1991 අංක 25 දරන විදුලි සංදේශ පනත යටතේ හෝ සිදුකරනු ලබන කිසියම් වෙනස් කිරීමක ප්‍රතිඵලයක් වශයෙන්, මෙහි සඳහන් කොන්දේසි සහ නියමයන් කලින් කලට වෙනස් විය හැකිය.

11.2 සේවා සම්බන්ධකිරීමේ ගාස්තු, මාසිකකුළිය සහ සේවා සම්බන්ධයෙන් අදාළවන ඕනෑම ගෙවීමක් සංශෝධනයට යටත්වන අතර මෙහි දක්වා ඇති කොන්දේසි සහ නියමයන් කලින් කලට වෙනස් වියහැකිය.

11.3 සේවා සම්බන්ධ කිරීමේ ගාස්තු, සම්මත දුරකථන සම්බන්ධතා සැපයීම සඳහා පමණක් අදාලවන අතර අතිරේක සේවා වන් අවශ්‍ය වන්නේ නම් ඒ අනුව එම ගාස්තු වෙනස් විය හැකිය.

11.4 තාක්‍ෂණික ශක්‍යතාවයනට සහ අදාලවන්නාවූ නැවත ස්ථානගත කිරීමේ සම්මත ගාස්තු වලට යටත්ව ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට තම තනි අභිමතය පරිදි හෝ පාරිභෝගිකයාගේ ඉල්ලීම මත, හෝ සේවා ස්ථාපනයක් නැවත ස්ථාන ගත කළ හැකිය.

## 12 ශ්‍රී ලංකා ටෙලිකොම් අයිතිවාසිකම්

12.1 පාරිභෝගිකයා මියගිය හොත් හෝ පරිශ්‍රය හැරගිය අවස්ථාවකදී හෝ ආරවුලක් පවතින අවස්ථාවක දුරකතන සේවය විසන්දි කිරීමේ අයිතිය එස්එල්ටී සතුව පවතී. කෙසේ වෙතත් එවැනි විසන්ධි කිරීමකින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමවෙත පාරිභෝගිකයාගේ බැඳීම්/වගකීම්වලට බලපෑමක් ඇති නොවන්නේය. පාරිභෝගිකයා මියගියහොත් පාරිභෝගිකයා තනි පුද්ගලයෙකු හෝ තනිඅයිතිකරුවෙකු නම් මෙම ගිවිසුම යටතේ සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ උරුමක්කාරයින් /පොල්මන්කාරයින් /අද්මිනිස්ත්‍රාසිකරුවන් පාරිභෝගිකයාගේ බැඳීම්/වගකීම් පවරාගනු ලබන්නේය. පාරිභෝගිකයා හවුල් ව්‍යාපාරයක්නම් ඉතිරි හවුල් කරුවන් සහ මියගිය හවුල්කරුගේ උරුමක්කාරයින්, පොල්මන්කාරයින්, අද්මිනිස්ත්‍රා සිකරුවන් ඒකාබද්ධව සහ වෙන්වෙන්ව මෙම ගිවිසුම යටතේ සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් පාරිභෝගිකයාගේ වගකීම් පවරාගනු ලබන්නේය. පාරිභෝගිකයා සමාගමක්නම් අනුප්‍රාප්තිකයින් සහ අවසරලත් පැවරුම් ලාභීන් බැඳීම්/වගකීම් පවරාගනු ලබන්නේය.

## 13 දැනුම් දීම්

පාරිභෝගිකයා වෙත අයදුම් පත්‍රයෙහි සඳහන් කරඇති ලිපිනයට තැපැල් මගින් දැනුම් දීම් කරනු ලැබේ ලිපිනය වෙනස් විමකදී එසේ වෙනස් වීමට එක් මාසයකට කලින් ඒ බව එස්එල්ටී වෙත දැනුම් දීමට පාරිභෝගිකයා භාරගනී. මෙහි සඳහන් කර ඇති පරිදි ලිපිනය වෙනස් විම නොදන්වා සිටීමේ හේතුවෙන්, පාරිභෝගිකයා වෙත කිසියම් දැනුම් දීමක් හෝ වෙනත් ලිපියක් නොලැබීයෑම පිළිබඳව එස්එල්ටී වගකීම දරනු නොලැබේ.

## 14.0 උපකරණ

14.1 සේවා සැපයීම සඳහා අවශ්‍ය දුරකථන උපකරණය ඇතුලුව, එහෙත් එයටම සීමා නොවූ පාරිභෝගික පරිශ්‍ර උපකරණ (Set up Box, Home gate Way) පාරිභෝගිකයාට සපයාදෙනු ලබන අතර සෑම අවස්ථාවකම එම මුල් උපකරණයේ අයිතිය ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගම සතු වන අතර මෙම ගිවිසුම අවසන් වුවහොත් පාරිභෝගිකයා විසින් එම උපකරණ එස්එල්ටී වෙත ආපසු භාර දිය යුතුය.

14.2 පාරිභෝගිකයා මෙගා ලයින් ඩබල් ප්ලේ පැකේජය තෝරාගත හොත් ඔහුට /ඇයට එක්කෝ ශ්‍රී ලංකා ටෙලිකොම් වෙතින් සපයන රවුටරය හෝ මොඩමය ලබාගැනීමට හෝ නැතහොත්, ඒවා ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රාදේශිය කාර්යාලයකින් ටෙලිෂොප් හෝ විවෘත වෙළඳපොලින් මිලදී ගැනීමට හෝ හැක. දවසේ පැය 24 පුරාම ඕනෑම එස්එල්ටී දුරකතනයකින් නොමිලයේ 1212 අංකය මගින් ප්‍රවේශ විය හැකි අන්තර්ජාල විමසීම් සේවය ඔස්සේ ශ්‍රී ලංකා ටෙලිකොම් පාරිභෝගිකයාට සහාය වනු ඇත. (සේවා ස්ථාපණයට පෙර පාරිභෝගික පරිශ්‍රය පරීක්‍ෂා කිරීමට අවශ්‍යවේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට කාර්මික නිළධාරියෙකුගේ සහාය ලබා දිය හැක).

14.3 ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට පාලනය කළ නොහැකි හේතූන් මත හෝ පාරිභෝගිකයාගේ පාර්ශවයෙන් සේවා සහ / හෝ උපකරණ සම්බන්ධයෙන් සිදුවන කිසියම් අනවසර ක්‍රියාවක් හානියක් හෝ පැහැර හැරීමක් සඳහා එස්එල්ටී වග නොකියන අතර එවැනි හානියක් සිදු වුවහොත් හෝ ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට අයත් උපකරණ නැතිවුවහොත් හෝ ඉල්ලා සිටි කල්හි පාරිභෝගිකයා විසින් ඒ සඳහා අලාභයක් සහ / හෝ ශ්‍රී ලංකා ටෙලිකොම්හි තනි අභිමතය පරිදි තීරණය කරනු ලබන වෙනත් යම් ගෙවීමක් කළ යුතුය.

14.4 පාරිභෝගිකයා විසින් කිසිදු එස්එල්ටී උපකරණයකට හානියක්, යා කිරීමක්, වෙනස් කිරීමක්, ඉවත් කිරීමක්, විකිණීමක් හෝ, මාරු කිරීමක් සිදු නොකළ යුතු අතර, වෙනත් විදුලි බලයෙන් ක්‍රියා කරණ උපකරණයක් ඒහා සම්බන්ධ නොකළ යුතුය ශ්‍රී ලංකා ටෙලිකොම්හි පූර්ව අනුමැතිය ලිඛිතව නොලබා වෙනත් අයෙකුට ඉහත සඳහන් කිසිදු ක්‍රියාවක් කිරීමට අවසර නොදියයුතුය. යම්හෙයකින් මෙම කොන්දේසිය උල්ලංඝණය කළහොත්, ඉල්ලා සිටි කල්හි, පාරිභෝගිකයා විසින් සහතික කළ වියදම සහ අලාභය එස්එල්ටී වෙත ගෙවිය යුතුය.

14.5 කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ටෙලිකොම්හි, පාරිභෝගිකයගේ කිසියම් මුදලක් තැන්පත්ව ඇත්නම්, මෙහි ඉහත 14.3 සහ 14.4 වගන්ති යටතේ සඳහන් අලාභ හෝ නැතිවීම් සඳහා වියදම අඩු කරගෙන එහි ශේෂය ආපසු දීමට ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට හිමිකම ඇත්තේය.

## 15.0 පැවරීම්

15.1 පාරිභෝගිකයාට ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමේ පූර්ව අනුමැතියකින් තොරව, මෙම ගිවිසුමෙහි කොන්දේසි සහ නියමයන් යටතේ දක්වා ඇති අයිතිවාසිකම් සහ / හෝ වගකීම්, කිසිදු තුන්වැනි පාර්ෂවයකට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පැවරීමට හෝ නැවත විකිණීමට නොහැක.

15.2 ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී සමාගමට එහි අභිමතය පරිදි මෙම ගිවිසුමෙහි කොන්දේසි සහ නියමයන් යටතේ දක්වා ඇති අයිතිවාසිකම් සහ වගකීම්, තුන්වැනි පාර්ෂවයකට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පැවරිය හැක.

## 16 දුරකථන සේවා

අ) රැහැන් සහිත දුරකථන සේවා

ජාත්‍යන්තර සෘජු ඇමතුම් පහසුකම් :

ජාත්‍යන්තර සෘජු ඇමතුම් පහසුකම් ලබාගෙන ඇති පාරිභෝගිකයෙක් රහස්‍ය සංකේත අංකය ලබා ගෙන ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම දී ඇති උපදෙස් අනුගමනය කිරීම සුදුසුය. රහස්‍ය සංකේතයක් ලබානොගත්තේ නම් සහ එය නිසි පරිදි භාවිත කර නොමැතිනම්, පාරිභෝගිකයාගේ දුරකතන අංකයෙන් ආරම්භවන සියලුම ඇමතුම් සඳහා පාරිභෝගිකයා සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම දී ඇති උපදෙස් අනුගමනය කිරීමට පාරිභෝගිකයා අපොහොසත්වීමේ හේතුවෙන්, පාරිභෝගිකයාට කිසියම් හානියක් හෝ අලාභයක් අත්විඳීමට සිදුවේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම වග කියනු නොලැබේ.

ආ) බ්‍රෝඩ් බෑන්ඩ් සේවා ( අයදුම් පත්‍රයෙහි 07 වැනි වගන්තියට වැඩිමනත් වශයෙනි)

අනවසර ප්‍රවේශවීම්

ශ්‍රී ලංකා ටෙලිකොම් උපකරණ වලින් හෝ, ශ්‍රී ලංකා ටෙලිකොම් සන්නිවේදන සේවා හරහා ප්‍රවේශ වන ජාල හෝ වෙනත් පරිගණක පද්දතියක් මගින් හෝ hack කිරීම ඇතුලුව, එහෙත් එයටම සීමානොවූ පාරිභෝගිකයාට අයිති නැති වෙනත් ගිණුමකට ප්‍රවේශය ලබාගැනීම (spoofing) හෝ, සාර්ථක වුවත් නැතත්, [illegible] පරිශීලකයින්ගේ සේවා ප්‍රතික්ෂේපණයට හේතුවිය හැකි සාමාන්‍ය පද්ධති මෙහෙයුම්වලට බාධා පැමිණ [illegible] අනවසර පරිගනක පද්දති තොරතුරු වලට ප්‍රවේශවීමට හෝ, වෙනස් කිරීමට පාරිභෝගිකයාගේ පාර්වයෙන් යම් උත්සහයක් දැරීම, සේවා වහාම අත් හිටුවීමට හේතුවනු ඇත. විස්තරාත්මක තොරතුරු සඳහා එස්එල්ටී වෙබ් පිටුව බලන්න.

සාධාරණ අන්තර්ජාල භාවිතය (අසීමිත බ්‍රෝඩ් බෑන්ඩ් පැකේජ භාවිතකරන පාරිභෝගිකයින්ට පමණි) එස්එල්ටී වෙබ් පිටුවෙහි විස්තර කරඇති පරිදි එස්එල්ටී බ්‍රෝඩ්බෑන්ඩ් සේවා වේගවත් බවටත් සෑම අවස්ථාවකදීම පාරිභෝගිකයින්ට ප්‍රවේශ විය හැකි බවටත්, ශ්‍රී ලංකා ටෙලිකොම් සහතික වන බව, පාරිභෝගිකයා පිළිගනී. මේඅනුව, අන්තර්ජාල අසීමිත බ්‍රෝඩ්බෑන්ඩ් පැකේජ භාවිතකරන පාරිභෝගිකයින්, අනෙකුත් ශ්‍රී ලංකා ටෙලිකොම් පාරිභෝගිකයින් සමග සාධාරන ආකාරයෙන් සේවා භාවිත කළ යුතුය.

ආරක්‍ෂණය

මෙම ලේඛණයෙහි සඳහන් වන නියමයන් හි යම් කඩකිරීමක් සම්බන්ධයෙන් වගකීම දරනු නොලබන කිසිදු තෙවැනි පාර්ශවයකට තොරතුරු හෙලිවන ආකාරයට, තම පරිශීලක අංකය හෙලි නොකළයුතුය. අවසරලත් පරිශීලකයින්ට පමණක් ප්‍රවේශ විය හැකි පරිදි, තම පරිගණක සම්පත් ආරක්‍ෂා කර ගැනීමට අවශ්‍ය සියලු සාධාරන පියවර ගැනීම සම්බන්ධයෙන් පාරිභෝගිකයා වගකිව යුතුය. එවැනි අවසර ලත් සහ/හෝ නොලත් තෙවැනි පාර්ෂවයක් විසින් මෙම ගිවිසුමෙහි යම් උල්ලංඝණය කිරීමක් කළ හොත්, පාරිභෝගිකයා ඒ සඳහා වගකිව යුතුය.

අගයානුකූල සේවා

මෙම ගිවිසුම යටතේ සපයා ඇති IP ලිපිනයන් ඔෆිස් / එක්සෙල් පැකේජයන් තෝරාගත් පාරිභෝගිකයාට අගය එකතුකිරීමක් වශයෙන් පාරිභෝගිකයා පිළිගනී.

නිසි අන්තර්ජාල පරිශීලනය

ශ්‍රී ලංකා ටෙලිකොම්හි ඒකීය මතයඅනුව වෙනත් පාරිභෝගිකයකු ශ්‍රී ලංකා ටෙලිකොම් සේවාවන් භාවිතකිරීම, පාරිභෝගිකයකුගේ කිසියම් ක්‍රියාවකින් සීමා කිරීම හෝ වැළැක්වීම තරයේ තහනම් කරනු ලැබේ. අසභ්‍ය වචන පාවිච්චි කිරීම. යමක් සිදු කිරීම හෝ කිරීමේ අදහසින් සාකච්චා කිරීම, නිත්‍යානුකූල නොවන [illegible] පළකිරීම්, සම්ප්‍රේශණය කිරීම්, දත්ත හුවමාරුකිරීම්, මේල් යැවීම්, ප්‍රවෘත්ති යැවීම, සහ කියවීම හෝ [illegible] නීතියක් උල්ලංඝණය කරමින්, වෙනත් යම් ආකාරයකින් දත්ත, ද්‍රව්‍ය, තොරතුරු, හෝ මෘදුකාංග මාරු කිරීම තහනම් වන අතර මෙම ගිවිසුම දැඩිව උල්ලංඝණය කළා සේ සැලකේ. එමනිසා ස්පෑම් වශයෙන් හඳුන්වනු ලබන ඉල්ලීමකින් තොරව යවන අනවශ්‍යදෑ සහ / හෝ වාණිජමය පණිවුඩ යැවීම සඳහා, පාරිභෝගිකයින් අන්තර්ජාල භාවිත නොකළ යුතුය. කර්තෘගේ හිමිකම් අයිතිය නිසි පරිදි ලබා නොගෙන, හිමිකම් අයිතිය යටතේ ආරක්‍ෂා වන කිසිවක් මොනයම් ආකාරයකින් හෝ අප්ලෝඩ් කිරීම යැවීම හෝ නැවත යැවීම සිදු නොකරන බවට පාරිභෝගිකයා විශේෂයෙන් එකඟ වේ. පොදුවේ. තෙවැනි පාර්ෂවයක බුද්ධිමය දේපළ අයිතිවාසිකම් කඩවන සේ පාරිභෝගිකයා විසින් සිදු කරනු ලබන ඕනෑම ක්‍රියාවක් දැඩි උල්ලංඝණයක් ලෙස අර්ථ විග්‍රහ කරනු ලැබේ.
විස්තරාත්මක තොරතුරු සඳහා එස් එල් ටී වෙබ් පිටුව බලන්න

ඇ) PEOTV සේවා (අයදුම් පත්‍රයෙහි 07 වැනි වගන්තියට වැඩිමනත් වශයෙනි)

සේවාවෙහි අන්තර්ගතය සහ විශේෂ පහසුකම්

අ) පාරිභෝගිකයාට දැනුම් දීමෙන් පසුව හෝ දැනුම් දීමකින් තොරව, සේවාවන් යටතේ සපයනු ලබන යම් විශේෂ පහසුකමක් ඇතුලුව, එහෙත් එයටම සීමා නොවූ කිසියම් පැකේජයක අන්තර්ගතයන් සහ / හෝ නාලිකා වෙනස් කිරීම් අයිතිය එස්එල්ටී සතුය. එසේම, සපයන ලද සේවාවන්හි කිසියම් විශේෂ පහසුකමක් තම තනි අභිමතය පරිදි වර්ධනය කිරීමේ, එකතු කිරීමේ, ඩවුන් ග්‍රේඩ් කිරීමේ සහ / හෝ මකා දැමීමේ අයිතිය එස්එල්ටී සතුය.

ආ) මෙමගින් සපයනු ලබන සේවාවන් ගෙවීම් කරනු ලබන රූපවාහිනී සේවාවන් බවත් එහි අන්තර්ගතයෙන් Electronic Programme Guide හි විශේෂ අංගයක් වන parental පාලනයට යටත් වන බවත් පාරිභෝගිකයා අවබෝධ කරගෙන සිටී. එකී විශේෂ පහසුකම ක්‍රියාත්මක කිරීමේදී විකාශය කරනු ලබන අන්තර්ගතය සම්බන්ධයෙන් පාරිභෝගිකයා සම්පූර්ණයෙන් වග කිව යුතුය.

ඇ) Electronic Programme Guide මගින් ඇනවුම් කරනු ලබන කිසියම් අමතර අන්තර්ගතයක් සඳහා ගාස්තු අයකිරීමේ අයිතිය එස්එල්ටී සතුය.

ඈ) බිල්පත් කටයුතු සඳහා a -la- carte පදනම මත තෝරා ගත් නාලිකා එක් මසක අවම කාලසීමාවකට අදාළ වන බවට පාරිභෝගිකයා එකඟ වේ

ඉ) මෙහි සපයන ලද අන්තර්ගතයන් කර්තෘ හිමිකම් නීතය යටතේ ආරක්‍ෂාවන අතර පාරිභෝගිකයා විසින් සේවා ඔස්සේ විකාශය කරනු ලබන එවැනි අන්තර්ගතයන් පිටපත් කිරීම, අනුරූප කිරීම (duplicate) හෝ නැවත විකාශය කිරීම සිදු නොකළ යුතුය තම සේවකයින්ට, ඒජන්තවරුන්ට සහ/හෝ නියෝජිතයින්ටද එසේ කිරීමට ඉඩ නොදිය යුතුය එවැනි අනවසර පිටපත් කිරීමක්. අනුරූප කිරීමක් (duplicate) හෝ නැවත විකාශය කිරීමක් සම්බන්ධ කිසියම් ක්‍රියාවකට පාරිභෝගිකයා වග කිව යුතුය